# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1487/8 – 2007 මාර්තු 05 වැනි සඳුදා – 2007.03.05

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

18 වැනි වගන්තිය යටතේ නියෝගය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 18 වගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව වැඩබලන මුදල් අමාත්‍ය රංජිත් සියඹලාපිටිය වන මම –

(අ) මෙම නියෝගයේ උපලේඛනයෙහි 1 කොටසෙහි නිශ්චිතව දක්වා ඇති යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් එම වගන්තියේ (2) උප වගන්තියේ කාර්යයන් සඳහා වන ක්‍රියාකාරකම් විය යුතු යයි; සහ

(ආ) එවැනි යම් ක්‍රියාකාරකමක යෙදී සිටින සහ උපලේඛනයේ II කොටසේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති මුදලට නොඅඩු ආයෝජනයක් කරන ලද සහ එම ආයෝජනය සම්පූර්ණ වශයෙන් කරන ලද්දේ සිය වාණිජමය මෙහෙයුම් ආරම්භ කළ දිනයේ සිට එක් අවුරුද්දකට නොවැඩි කාලයක් තුළදී නම් එවැනි ව්‍යවසායකින් සමාගමක් ලබන ලාභ සහ ආදායම උපලේඛනයේ II කොටසේ II වන තීරුවේ අනුරූප සටහනෙහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු යයි;

මෙම නියෝගය මගින් තීරණය කරමි.

රංජිත් සියඹලාපිටිය,
*වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.*

2007 මාර්තු මස 01 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

උපලේඛනය

I කොටස

ක්‍රියාකාරකම්

1. කිසියම් ගුවන් තොටුපලක්, වරායක්, මහාමාර්ගයක් හෝ දුම්රිය මාර්ගයක් සංවර්ධනය කිරීම.
2. කිසියම් කර්මාන්ත පුරයක් සංවර්ධනය කිරීම.
3. කිසියම් ගුදමක් හෝ ගබඩාවක් සංවර්ධනය කිරීම.
4. කිසියම් සනීපාරක්ෂක පහසුකමක් හෝ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් සැපයීම.
5. බල ශක්ති උත්පාදනය, සම්ප්‍රේෂණය හෝ බෙදාහැරීම.
6. ජල සම්පාදන සේවා සංවර්ධනය.
7. නාගරික නිවාස හෝ නගර මධ්‍යස්ථාන සංවර්ධනය.
8. රෝහල් ඉදිකිරීම.

II කොටස

| I තීරුව<br>ආයෝජිත මුදල (රුපියල් මිලියන) | II තීරුව<br>නිදහස් කරනු ලබන<br>කාල සීමාව (අවුරුදු) |
|---|---|
| 1,000 | 06 |
| 2,500 | 08 |
| 5,000 | 10 |
| 7,500 | 12 |

මෙම නියෝගයේ කාර්යයන් සඳහා ආයෝජනය යනුවෙන් අදහස් කරනුයේ ස්කන්ධ හෝ ණය මගින් අරමුදල් සම්පාදිත ව්‍යාවසායක සම්පූර්ණ පිරිවැය වේ.

03-602

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.